අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යායපත්‍රය සකස් කිරීමේ දී සමාජයේ විවිධ ස්තර සහ කණ්ඩායම් නියෝජනය කරන පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සහ යෝජනා මෙන් ම ඊට පෙර ජාතික බලවේග විසින් රටට ඉදිරිපත් කළ පහත සඳහන් මහජන කොමිසම් වාර්තා සහ දේශීය කර්මාන්තකරුවන් නියෝජනය කරමින් මව්බිම ලංකා පදනම විසින් ඉදිරිපත් කළ යෝජනා සියල්ල ඉතා බරපතල ලෙස සැලකිල්ලට ගනු ලැබූ බව ද දන්වා සිටින වග යි.

1. ජාතික මහජන සභාව විසින් ඉදිරිපත් කළ හැට එක් වැදෑරුම් සමාජ ගිවිසුම (2022)

2. ජාතික විද්වද් භික්ෂු සංසදය විසින් පිහිටුවන ලද මහජන කොමිසමේ වාර්තාව (සම්මුතියේ මාළිමාව) මගින් ඉදිරිපත් කළ යෝජනා (2019)

3. බෞද්ධ පුනර්ජීවන කොමිසමේ වාර්තාව (2013)

4. ජාතික පුනර්ජීවන කොමිෂන් සභාවේ වාර්තාව (2009 - 2010)

5. මව්බිම ලංකා පදනම විසින් යුද ජයග්‍රහණයට පසු ව ඉදිරිපත් කළ ආර්ථික වැඩ පිළිවෙළ (2009)

ජනගත කිරීම - 2024.08.13

- අර්බුදයෙන් එළියට... නව ව්‍යවස්ථාවක්...
- නව ආර්ථික මොඩලයක්... සමෘද්ධිමත් දේශයක්...
- ස්වෛරීත්වයට මුල් තැන දෙන රාජ්‍යයක්... යුක්තිගරුක පාලනයක්...
- සභ්‍යත්වය විසින් මෙහෙයවනු ලබන විනිසෙක්... සතුට පිරුණු සමාජයක්...

## අනාගත ආණ්ඩුවක ප්‍රමුඛතා න්‍යායපත්‍රය

# 60 වැදෑරුම් සමාජ සම්මුතිය

**සියලු ම ජනාධිපති අපේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන වග යි!**

ඉදිරිපත් කිරීම

**ජාතික විද්වද් භික්ෂු සංසදය ප්‍රමුඛ ජාතික සංවිධාන**